# තවාෂි බුරුසු නිෂ්පාදනය

නිශාන්ත මොරවක
ව්‍යාපාර ප්‍රවර්ධන කළමනාකාර
කාර්මික තොරතුරු අංශය

පොල් කෙඳි ආශ්‍රිතව කරන නිෂ්පාදන අතර බුරුසු නිෂ්පාදනයද ප්‍රධාන තැනක් ගනී. මෙම බුරුසු අවශ්‍යතාවය අනුව විවිධ වර්ගයන්ගෙන් නිෂ්පාදනය කරනු ලැබේ. තවාෂි බුරුසු නිෂ්පාදනය ක්‍රමවත්ව සකස් කරගත් හොඳ තත්ත්වයේ බ්‍රිස්ටල් කෙඳි භාවිතයෙන් සිදු කරනු ලැබේ. මෙම බුරුසු සඳහා දිනෙන් දින වර්ධනය වන වෙළඳපොළක් දැකිය හැකිය. ඊට හේතුව තවාෂි බුරුසු භාවිතා වන්නේ නාන කාමර හා මුළු තැන් ගෙයි ඇති බේසම්, භාජන ආදිය සඳහාත් බුමුතුරුණු, මෙට්ට, පාවහන්වල ඇති දූවිලි ඉවත් කිරීම ආදී පවිත්‍ර කිරීමේ කටයුතු සඳහාත් වීමය.

ශ්‍රී ලංකාවේ තවාෂි බුරුසු නිෂ්පාදනය ප්‍රධාන වශයෙන් අපනයනය ඉලක්ක කරගත් එකකි. ජපානය මෙම බුරුසු භාවිතය අතින් ඉහළ ස්ථානයක සිටින අතර, තවාෂි බුරුසු සඳහා විශාල ඉල්ලුමක් එම රටේ ඇත.

## වර්තමාන වෙළඳපොළ

තවාෂි බුරුසු සඳහා ජපානය ප්‍රධාන ගැනුම්කරු ලෙස 1980 දශකයේ පැවතියද වර්තමානයේදී යුරෝපීය රටවල් කරාද වෙළඳපොළ ව්‍යාප්ත වෙමින් පවතී. නමුත් වර්තමානයේ දී පවා තවාෂි බුරුසු 90% ක් පමණ අපනයනය කරනු ලබන්නේ ජපාන වෙළඳපොළටය. සාමාන්‍යයෙන් ජපානයේ වර්ෂයකට විවිධ වර්ගයන්ගෙන් යුත් තවාෂි බුරුසු මිලියන 120 ප්‍රමාණයක පරිභෝජනයක් ඇත. ඒ අතර පහත වර්ග දැක්විය හැකිය.

- ස්පොන්ජ් තවාෂි - Sponge Tawashi
- කොයාර් ,, - Coir ,,
- මෙටල් ,, - Metal ,,
- නයිලොන් ,, - Nylon ,,
- සීසල් ෆයිබර් ,, - Sisal Fiber Tawashi

ස්පොන්ජ් තවාෂි බුරුසු සඳහා ජපානයේ වැඩිම වෙළඳපොළක් හිමිවන අතර, දෙවන තැන හිමි කොයාර් තවාෂි බුරුසුවල වාර්ෂික අවශ්‍යතාවය මිලියන 30 - 35 ක් පමණ වේ. පිරිසිදු කිරීමේ කටයුතුවලදී උපකරණ පළුදු හෝ සීරීම්වලට ලක් නොවීම හා භාවිතයෙන් පසු විනාශ කිරීමට ඇති පහසුව කොයාර් බුරුසුවල විශේෂිත ලක්ෂණය වේ.

## වෙළඳපොළ ( දේශීය )

මුළුතැන්ගෙයි උපකරණ, කර්මාන්තශාලා උපකරණ හා නාන කාමර, වැසිකිලි උපකරණ පිරිසිදු කිරීමේදී තවාෂි බුරුසු පාවිච්චිය ප්‍රචලිත වී ඇති බැවින්, දේශීයවද හොඳ වෙළඳපොළක් ගොඩනැගී ඇත. ශ්‍රී ලංකාවේ වෙළඳපොළ ඉල්ලුම වර්තමාන නිවාස ප්‍රමාණය සැලකිල්ලට ගෙන සනාථ කළ හැකිවේ.

මෙම බුරුසු සඳහා පාරිභෝගික මෙන්ම ආයතනික වෙළඳපොළක්, එනම් රජයේ හා පෞද්ගලික ආයතන, කාර්යාල, හෝටල්, නේවාසිකාගාර ආදී විවිධ අංශයන්ගෙන් ජනිතවන බැවින්, දේශීය වශයෙන් හොඳ වෙළඳපොළක් බලාපොරොත්තු වියහැකිය.

## වෙළඳපොළ වර්ධනය

තවාෂි බුරුසු මගින් පිරිසිදු කිරීමට ලක්වන භාණ්ඩ හා උපකරණ සීරීම්, පළුදුවීම්වලට ලක්නොවන බැවින්ද, ස්වභාවික කෙඳි ඇසුරින් නිපදවන්නක් බැවින් හා ඒ හා සමාන බහුල ලෙස ලැබෙන වෙනත් අමුද්‍රව්‍යයක් නොමැති බැවින්, මෙම බුරුසුවලට වෙළඳපොළේ තවත් දිගු කලක් රැඳී සිටීමේ හැකියාව පවතී. එමෙන්ම පිරිසිදු කිරීමේ කාර්යය සඳහා නිවෙස්වල සිට විශාල කම්හල් දක්වා භාවිතාවන භාණ්ඩයක් බැවින් මේ තත්ත්වය වඩාත් තහවුරු වේ.

## සැපයුම

විවිධ ප්‍රමාණයන්ගෙන්, හැඩයෙන් හා ගැඩයෙන් යුත් බුරුසු ගැනුම්කරුවන්ගේ පිරිවිතරයන් අනුව විදේශීය වෙළඳපොළට සැපයීම මෙන්ම දේශීය වෙළඳපොළටද සැපයීම ආයතන රාශියක් මගින් සිදු කෙරේ.

## නිෂ්පාදන අවශ්‍යතාවයන් හා ක්‍රියාවලිය

### ඉඩම් හා ගොඩනැගිලි අවශ්‍යතාවය

| | |
|---|---|
| අවශ්‍ය භූමි ප්‍රමාණය | - පර්චස් 20 |
| ගොඩනැගිල්ල | - 24 x 30 |
| ගොඩනැගිලි භාවිතය | - යන්ත්‍ර සූත්‍ර සවිකිරීම |
| | - නිමි භාණ්ඩ ගබඩාකර තබා ගැනීම |
| | - අමුද්‍රව්‍ය ගබඩාකර තබා ගැනීම |

ඉතිරිය භූමි ප්‍රමාණය අමුද්‍රව්‍ය වියළා ගැනීම සඳහා භාවිතා කළ හැකිය.

## අමුද්‍රව්‍ය

- බ්‍රිස්ටල් පොල් කෙඳි
- ගැල්වනයිස් කළ කම්බි ( මි.මි 2 ½ ගනකම ඇති)
- ලී මිටි ( අඟල් 18 ක් දිග අඟල් 01 ක විෂ්කම්භය )
- තීන්ත ( ලී සඳහා )

## යන්ත්‍රෝපකරණ

තවාෂි බුරුසු නිෂ්පාදනය සඳහා අවශ්‍ය වන්නේ දේශීයව නිපදවා ගත හැකි සරල යන්ත්‍ර කිපයකි.

- කොහු කපන යන්ත්‍රය
- කම්බි කපන යන්ත්‍රය
- බුරුසු ඇඹරීමේ යන්ත්‍රය
- හැඩ කැපීමේ යන්ත්‍රය

## නිෂ්පාදන ක්‍රියාවලිය

ප්‍රථමයෙන් බ්‍රිස්ටල් කෙඳි අවශ්‍ය ප්‍රමාණයට කපා ගනු ලැබේ. මේ සඳහා බ්‍රිස්ටල් කෙඳි කැපීමේ යන්ත්‍රය භාවිතා කරනු ලැබේ. එලෙසම කෙඳි තබා ඇඹරීම සඳහා අවශ්‍ය ප්‍රමාණයට කපාගත යුතුය. අවශ්‍ය ප්‍රමාණයට කැපූ කම්බිය ගෙන එම කම්බිය දෙපොටක් වනසේ ඇඹරීමේ යන්ත්‍රය මත සවිකර එම කම්බි දෙපොට මැද කොහු තබා කරකැවීමෙන් අවශ්‍ය පරිදි බුරුසුවක් සාදා ගත හැකිය. මෙය බුරුසු ඇඹරීමේ යන්ත්‍රය භාවිතයෙන් කළ හැකිය. මෙම යන්ත්‍රය ක්‍රමාණුකූලව ක්‍රියා කරවීමෙන් නියම තත්වයෙන් යුත් බුරුසුවක් සෑදිය හැකිවේ. මෙසේ සාදා ගන්නා ලද බුරුසුව ඔපමට්ටම් කිරීම සඳහා හැඩ කැපීමේ යන්ත්‍රය භාවිතා කරනු ලැබේ. එමගින් අනවශ්‍ය කොහු කැබලි කපා ඉවත්කර බුරුසුව සඳහා දැකුම්කළු නිමාවක් ලබාදිය හැකි වේ.

## නිෂ්පාදන ක්‍රියාවලිය

